# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2182/35 - 2020 ජූලි මස 01 වැනි බදාදා - 2020.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. යොමු අංකය:* හගු/ප්‍රාලේ/3/2/1/495 C II.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 13/97/ඊ/456.

මප/හගු/දියතිලක මධ්‍ය මහා විද්‍යාලයේ සංවර්ධන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියතිලක කෝරළේ, අංක 495සී පල්ලෙමළුව ග්‍රාම නිළධාරී වසමේ හඟුරන්කෙත නමැති ග්‍රාමයේ මූ.පි.නු. 3398 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් මැන ඇති පල්ලෙමළුව නමැති ප්‍රමාණයෙන් අක්කර 02, රූඩ් 02, පර්චස් 18.7 කින් (හෙක්ටයාර් 1.0591) සමන්විත වූ පහත දැක්වෙන ඉඩම.

කැබලි අංකය 01

ඉඩමේ නම: පල්ලෙමළුව; ඉඩමේ හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: අ. 2, රූඩ් 2, පර්. 18.7 (හෙක්ටයාර් 1.0591).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය පවරන ලද අයවලුන් හෝ 2020.07.24 දින පෙරවරු 9.30ට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020.07.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳව ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

2020 ජූලි මස 01 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 435